දිනමිණ සිළුමිණ The Silumina epaper

# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## මේසන් (සුදුසුකම්ලත් අපේක්ෂකයන් සඳහා)
## [කාන්තා / පුරුෂ]

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරයි.**

කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලයේ මේසන් තනතුරෙහි සේවය කිරීම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තෝරාගන්නා ලද අපේක්ෂකයා ඇමෙරිකානු රජයට අයත් නේවාසික හෝ කල්බදු ක්‍රමය යටතේ පවතින පරිශ්‍රවල ඉදිකිරීම්, නඩත්තු, අලුත්වැඩියා ඇතුලු සියලුම ආකාරයේ පුහුණු මේසන් වැඩ සිදුකළ යුතුවේ. එසේම කොන්ක්‍රීට් බ්ලොක් සෑදීම, වැරගැන්වූ කොන්ක්‍රීට් වැඩ, ගල් වැඩ ආදියද, වැලි-සිමෙන්ති ප්ලාස්ටර්, ජිප්සම් ප්ලාස්ටර්, ඇතුරුම් වැනි මතුපිට නිම කිරීම් කටයුතුවල ප්‍රධාන මේසන් ශිල්පියා ලෙස ක්‍රියා කළ යුතුය.

තවද බිත්ති සවිකිරීම, හානි වූ බිත්ති අලුත්වැඩියා කිරීම සහ තීන්ත පිරියම් කිරීමට බිත්ති මතුපිට සූදානම් කිරීමද සිදුකළ යුතුය. තනතුර දරන්නා වඩු කාර්මික වැඩ මූලිකයාගේ සාමාන්‍ය අධීක්ෂණය යටතේ කටයුතු කරන අතර එම වැඩ මූලිකයාගෙන් ලැබෙන මෙහෙයවීම්, වාචික උපදෙස්, වැඩ විධාන මත අවශ්‍ය නඩත්තු, අලුත්වැඩියා හෝ සවිකිරීම් නියමිත කර්මාන්ත භාවිතයන්, ප්‍රමිතීන් සහ විධික්‍රම අනුව නිමකළ යුතුය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇ. ඩො 371.41 කි.**

[වේතන ඇමෙරිකානු ඩොලර් මගින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2024 ජනවාරි 02 වනදා වන විට විනිමය අනුපාතය ඇ. ඩො. 1 = රු. 321.50 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.]

**අවශ්‍ය සුදුසුකම්:**

1. **අධ්‍යාපනය -** අ.පො.ස. සාමාන්‍ය පෙළ සඳහා සහභාගී වී තිබිය යුතුය. (සියලුම විෂයයන් හෝ නියමිත විෂයයන්ගෙන් අවම වශයෙන් 50% කටවත් මුහුණ දී තිබිය යුතු වේ). තවද මේසන් කර්මාන්තය, ඉදිකිරීම්, සිවිල් ඉංජිනේරු හෝ ඊට අදාළ කර්මාන්තයක පුහුණු තාක්ෂණික ශිල්පීන් බිහිකරන පිළිගත් ආයතනයක මාස 6ක වෘත්තීය පුහුණුවක් සම්පූර්ණ කර තිබිය යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)**

2. **පූර්ව රැකියා පළපුරුද්ද -** පිළිගත් ආයතනයක හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව පුහුණු මට්ටමේ මේසන්වරයෙකු ලෙස අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද තිබිය යුතුය. **(අදාළ සේවා ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)**

3. **භාෂා ප්‍රවීණතාවය -** II වන මට්ටමේ ඉංග්‍රීසි භාෂාව (සීමිත දැනුම) කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ.)**
   III වන මට්ටමේ සිංහල සහ/හෝ දෙමළ භාෂාව (මනා කාර්යස්ථ දැනුම) කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4. **සේවා දැනුම -** තරු පන්තියේ හෝටල් කර්මාන්තයට අදාළ ගොඩනැගිලි සේවා සහ ප්‍රමිතීන් පිළිබඳ මනා ප්‍රායෝගික දැනුමක් තිබිය යුතුය. නඩත්තු කර්මාන්තය, ආම්පන්න සහ පිළිගත් නඩත්තු භාවිතයන් සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. ආරක්ෂණ ක්‍රම, පුද්ගලික ආරක්ෂණ උපකරණ සහ ක්‍රියාපටිපාටීන් සම්බන්ධයෙන් නිසි දැනුමක් තිබිය යුතුය.

5. **නිපුණතා සහ හැකියාවන් -** සාමාන්‍යයෙන් භාවිතා කරන අත් මෙවලම්, අතින් හසුරුවන කුඩා විදුලි මෙවලම්, වැකියුම් ක්ලීනර්, මේසන් මෙවලම් සහ ඉණිමං භාවිතයට හැකියාව තිබිය යුතුය.
   වැඩකරන ස්ථානය පිරිසිදුව සහ පිළිවෙලට තබාගැනීමට දක්ෂ විය යුතුය. මනා ආරක්ෂක භාවිතයන් තිබිය යුතු අතර කාර්යයන් සිදුකිරීමේදී සම්මත ආරක්ෂන ක්‍රම අනුගමනය කරමින් ආරක්ෂාව තහවුරු කළ යුතුය. එසේම අවශ්‍ය පුද්ගලික ආරක්ෂණ උපකරණ නිසි පරිදි භාවිතා කිරීමට හැකිවිය යුතුය.
   B පංතියේ ද්වි-කාර්යය වාහන පැදවීම සඳහා වලංගු, කල් ඉකුත් නොවූ රිය ධාවන බලපත්‍රයක් තිබිය යුතුය.

**අවශ්‍ය ලේඛන:**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතුය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)
- රිය ධාවන බලපත්‍රයේ පිටපත (ද්විත්ව පැති)

**අයදුම් කරන ආකාරය:**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින්අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2024 පෙබරවාරි 08 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.